Kuchchaveli Ceramics - Data

| DATE | SITE | TEST PIT | LAYER | FORM | WARE | PIECSS | WEIGHT | D.M | REM AKS | A-I |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2011 | KCH | - | (x) | 24/B/B/1 | RED WARE | 01 | 100g | - | - | I |
| | | | | | RED WARE | | | | | |
| 2011 | KCH | 1 | (2) | NEW | RED WARE | 01 | 150g | - | - | - |
| 2011 | KCH | 1 | (2) | 66/A/A/1 | RED WARE | 06 | 50g | 24cm | - | - |
| 2011 | KCH | 1 | (2) | 62/F/A/1 | RED WARE | 01 | 500g | 8cm | - | - |
| 2011 | KCH | 1 | (2) | 28/B/A/1 | RED WARE | 07 | <50g | 28cm | - | A C |
| 2011 | KCH | 1 | (2) | 6/D/A/1 | RED WARE | 49 | 2500g | 34-24cm | - | AC |
| 2011 | KCH | 1 | (2) | 65/B/A/1 | RED WARE | 04 | 50g | 22cm | - | A |
| 2011 | KCH | 1 | (2) | 31/A/A/1 | RED WARE | 01 | <50g | 22cm | - | AC |
| 2011 | KCH | 1 | (2) | 31/A/A/2 | RED WARE | 01 | <50g | 20cm | - | AC |
| 2011 | KCH | 1 | (2) | 4/A/A/1 | RED WARE | 01 | <50g | 22cm | - | ABC |
| 2011 | KCH | 1 | (2) | 2/CA/1 | B.R.W.MEDIUM | 01 | <50g | 20cm | - | ABC |
| 2011 | KCH | 1 | (2) | 14/R/A/2 | RED WARE | 01 | <50g | 14cm | - | ABC |
| 2011 | KCH | 1 | (2) | 15/B/A/1 | RED WARE | 03 | 100g | 24cm | - | ABC |
| 2011 | KCH | 1 | (2) | 8/A/A/1 | RED WARE | 01 | <50g | 12cm | - | ABC |
| 2011 | KCH | 1 | (2) | 14/K/A/A 1 | RED WARE | 01 | <50g | 12cm | - | ABC |
| 2011 | KCH | 1 | (2) | 14/A/B/2 | RED WARE | 01 | <50g | 14cm | - | AB |
| 2011 | KCH | 1 | (2) | 4/E/A/1 | RED WARE | 01 | <50g | 12cm | - | AB |
| 2011 | KCH | 1 | (2) | 10/B/A/1 | RED WARE | 01 | <50g | 10cm | - | AB |
| 2011 | KCH | 1 | (2) | 2/E/A/1 | RED WARE | 06 | 250g | 18cm | - | AC |
| 2011 | KCH | 1 | (2) | 1/A/A/1 | RED WARE | 08 | 250g | 18cm | - | AC |
| 2011 | KCH | 1 | (2) | 8/N/A/1 | RED WARE | 01 | <50g | 18cm | - | ABC |
| 2011 | KCH | 1 | (2) | 8/F/A/2 | RED WARE | 01 | 50g | 10cm | - | ABC |
| 2011 | KCH | 1 | (2) | 14/A/B/1 | RED WARE | 04 | 50g | 16cm | - | ABC |
| 2011 | KCH | 1 | (2) | 37/D/A/2 | C H WARE | 01 | <50g | 20cm | - | AC |
| 2011 | KCH | 1 | (2) | 10/D/A/1 | RAD WARE | 01 | <50g | 12cm | - | ABC |
| | | | | | | | | | | |
| 2011 | KCH | 3 | (2) | 79/A/A/1 | B.R.W | 01 | <50g | 4cm | - | AC |
| 2011 | KCH | 3 | (2) | 6/D/A/2 | RED WARE | 06 | 150g | 22cm | - | ABC |
| 2011 | KCH | 3 | (2) | 28/B/A/1 | RED WARE | 15 | 350g | 20cm | - | AC |
| 2011 | KCH | 3 | (2) | 18/A/A1 | RED WARE | 01 | <50g | 12cm | - | ABC |
| 2011 | KCH | 3 | (2) | 18/B/A/1 | RED WARE | 01 | <50g | 14cm | - | ABC |
| 2011 | KCH | 3 | (2) | 6/D/A/1 | RED WARE | 39 | 1400g | 24-34cm | - | AC |
| 2011 | KCH | 3 | (2) | 31/A/A1 | RED WARE | 07 | 200g | 22cm | - | AC |
| 2011 | KCH | 3 | (2) | 8/B/A/1 | RED WARE | 04 | 200g | 12cm | - | ABC |
| 2011 | KCH | 3 | (2) | 1/C/A/1 | RED WARE | 01 | <50g | 20cm | - | AE |
| 2011 | KCH | 3 | (2) | 14/M/A/1 | RED WARE | 02 | <50g | 10cm | - | ABC |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2011 | KCH | 3 | (2) | 14/L/A/1 | RED WARE | 04 | <50g | 10cm | - | ABC |
| 2011 | KCH | 3 | (2) | 14/B/A/2 | RED WARE | 01 | <50g | 10cm | - | ABC |
| 2011 | KCH | 3 | (2) | 2/E/A/1 | RED WARE | 05 | <50g | 14cm | - | ABC |
| 2011 | KCH | 3 | (2) | 2/A/B/1 | RED WARE | 01 | <50g | 18cm | - | ABC |
| 2011 | KCH | 3 | (2) | 14/I/A/3 | RED WARE | 01 | <50g | 10cm | - | ABC |
| | | | | | | | | | | |
| 2011 | KCH | 6 | (2) | 18/B/A/1 | RED WARE | 01 | <50g | 14cm | - | ABC |
| 2011 | KCH | 6 | (2) | 31/A/E/1 | RED WARE | 01 | <50G | 20cm | - | ABC |
| 2011 | KCH | 6 | (2) | 6/D/A/1 | RED WARE | 23 | 750g | 22cm | - | AC |
| 2011 | KCH | 6 | (2) | 31/A/A/1 | RED WARE | 04 | 50g | 18-22cm | - | AC |
| 2011 | KCH | 6 | (2) | 28/B/A/1 | RED WARE | 03 | 100g | 28cm | - | AE |
| 2011 | KCH | 6 | (2) | 20/F/A/1 | RED WARE | 02 | <50g | 16cm | - | AB |
| 2011 | KCH | 6 | (2) | 14/R/A/2 | RED WARE | 01 | <50g | 12cm | - | AB |
| 2011 | KCH | 6 | (2) | 19/C/A/1 | RED WARE | 01 | <50g | 14cm | - | AC |
| 2011 | KCH | 6 | (2) | 14/Q/A/1 | RED WARE | 01 | <50g | 14cm | - | AC |
| 2011 | KCH | 6 | (2) | 14/A/A1 | RED WARE | 01 | 50g | 16cm | - | AC |
| 2011 | KCH | 6 | (2) | 14/A/B/2 | RED WARE | 01 | 50g | 20cm | - | AC |
| 2011 | KCH | 6 | (2) | 14/K/A/1 | RED WARE | 01 | <50g | 24cm | - | AC |
| 2011 | KCH | 6 | (2) | 14/C/A/1 | RED WARE | 01 | <50g | 16cm | - | AC |
| 2011 | KCH | 6 | (2) | 79/A/A/1 | RED WARE | 01 | <50g | 4cm | Disk | - |
| 2011 | KCH | 6 | (2) | 79/A/A/1 | RED WARE | 01 | <50g | 3cm | Disk | - |
| 2011 | KCH | 6 | (2) | 79/A/A/1 | RED WARE | 01 | <50g | 2cm | Disk | - |
| 2011 | KCH | 6 | (2) | 6/D/A/1 | RED WARE | 01 | <50g | 24cm | - | AC |
| 2011 | KCH | 6 | (2) | 2/F/B/1 | RED WARE | 01 | 50g | 24cm | - | ABC |
| | | | | | | | | | | |
| 2011 | KCH | 1 | (3) | 24/C/A/1 | RED WARE | 03 | 50g | - | - | I |
| 2011 | KCH | 1 | (3) | NEW(62) | RED WARE | 01 | 150g | - | - | GH |
| 2011 | KCH | 1 | (3) | 6/D/A/1 | RED WARE | 63 | 2700g | 24cm | - | ABC |
| 2011 | KCH | 1 | (3) | 23/D/A/1 | RED WARE | 01 | <50g | 14cm | - | AC |
| 2011 | KCH | 1 | (3) | 6/O/A/1 | RED WARE | 01 | 50g | 24cm | - | ABC |
| 2011 | KCH | 1 | (3) | 28/B/A/1 | RED WARE | 15 | 350g | 24cm | - | AE |
| 2011 | KCH | 1 | (3) | 65/A/A/1 | RED WARE | 02 | 100g | 22cm | - | AC |
| 2011 | KCH | 1 | (3) | 31/A/A/1 | RED WARE | 04 | 50g | 22cm | - | AC |
| 2011 | KCH | 1 | (3) | 3/A/A/1 | RED WARE | 85 | 2000g | 14cm | - | ABC |
| 2011 | KCH | 1 | (3) | 2/A/A/1 | RED WARE | 27 | 500g | 20cm | - | ABC |
| 2011 | KCH | 1 | (3) | 60/B/A/1 | RED WARE | 22 | 300g | 20cm | - | AC |
| 2011 | KCH | 1 | (3) | 1/E/A/2 | RED WARE | 04 | 50g | 20cm | - | AC |
| 2011 | KCH | 1 | (3) | 1/E/A/1 | RED WARE | 03 | 50g | 24cm | - | AC |
| 2011 | KCH | 1 | (3) | 14/E/A/2 | RED WARE | 02 | 50g | 14cm | - | ABC |
| 2011 | KCH | 1 | (3) | 2/F/C/1 | RED WARE | 01 | 50g | 18cm | - | ABC |
| 2011 | KCH | 1 | (3) | 4/A/A/2 | RED WARE | 07 | 50g | 12cm | - | ABC |
| 2011 | KCH | 1 | (3) | 8/B/A/3 | RED WARE | 07 | 100g | 28cm | - | AC |
| 2011 | KCH | 1 | (3) | 2/A/A/1 | RED WARE | 01 | <50g | 18cm | - | AC |
| 2011 | KCH | 1 | (3) | 1/E/A/1 | RED WARE | 07 | 100g | 18cm | - | AE |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2011 | KCH | 1 | (3) | 2/I/A/1 | RED WARE | 03 | <50g | 16cm | - | ABC |
| 2011 | KCH | 1 | (3) | 4/A/A/1 | RED WARE | 01 | <50g | 18cm | - | ABC |
| 2011 | KCH | 1 | (3) | 66/B/A/1 | RED WARE | 10 | 80g | 24-18cm | - | AE |
| 2011 | KCH | 1 | (3) | 31/A/A2 | RED WARE | 03 | 50g | 14cm | - | AC |
| 2011 | KCH | 1 | (3) | 6/L/A/1 | RED WARE | 01 | <5Og | 12cm | - | ABC |
| 2011 | KCH | 1 | (3) | 4/D/A/1 | RED WARE | 01 | <50g | 24cm | - | ABC |
| 2011 | KCH | 1 | (3) | 10/B/A/1 | RED WARE | 02 | <50g | 10cm | - | AB |
| 2011 | KCH | 1 | (3) | 65/B/A/1 | RED WARE | 05 | 50g | 22cm | - | AE |
| | | | | | | | | | | |
| 2011 | KCH | 3 | (3) | 62/D/A/1 | RED WARE | 01 | 50g | - | - | - |
| 2011 | KCH | 3 | (3) | 79/A/A/1 | R.W. THICKNES | 01 | 50g | 4cm | - | - |
| 2011 | KCH | 3 | (3) | 79/A/A/1 | RED WARE | 01 | 50g | 2cm | disk | |
| 2011 | KCH | 3 | (3) | 6/D/A/2 | RED WARE | 03 | 50g | 24cm | - | ABC |
| 2011 | KCH | 3 | (3) | 76 | RED WARE | 108 | 3700g | - | - | - |
| | | | | | | | | | | |
| 2011 | KCH | 6 | (3) | 37/A/A/1 | RED WARE | 01 | <50g | 12cm | - | - |
| 2011 | KCH | 6 | (3) | 79/A/A/1 | RED WARE | 03 | <50g | - | - | - |
| 2011 | KCH | 6 | (3) | 6/D/A/A/2 | RED WARE | 30 | 1000g | 18cm | - | AC |
| 2011 | KCH | 6 | (3) | 31/A/B/1 | RED WARE | 07 | 500g | 18cm | - | AC |
| 2011 | KCH | 6 | (3) | 6/B/A/1 | RED WARE | 01 | 50g | 16cm | - | ABC |
| 2011 | KCH | 6 | (3) | 6/D/A/1 | RED WARE | 01 | 50g | 14cm | - | ABC |
| 2011 | KCH | 6 | (3) | 65/B/A/1 | RED WARE | 01 | 50g | 22cm | - | AE |
| 2011 | KCH | 6 | (3) | 31/A/A/2 | RED WARE | 06 | 100g | 18cm | - | AC |
| 2011 | KCH | 6 | (3) | 20/F/A/1 | RED WARE | 01 | <50g | 6cm | - | AB |
| 2011 | KCH | 6 | (3) | NEW | RED WARE | 01 | 50g | - | - | - |
| 2011 | KCH | 6 | (3) | 60/B/A/2 | RED WARE | 02 | 50g | 14cm | - | AB |
| 2011 | KCH | 6 | (3) | 1/E/A/3 | RED WARE | 01 | 50g | 14cm | - | AC |
| 2011 | KCH | 6 | (3) | 2/F/A/1 | RED WARE | 01 | <50g | 16cm | - | AC |
| 2011 | KCH | 6 | (3) | 6/B/A/1 | RED WARE | 03 | 50g | 14cm | - | ABC |
| | | | | | | | | | | |
| 2011 | KCH | 1 | (4) | 28/B/A/1 | RED WARE | 23 | 1450g | 20cm | - | AC |
| 2011 | KCH | 1 | (4) | 56/C/A/1 | CH WARE | 04 | 100g | 22cm | - | AC |
| 2011 | KCH | 1 | (4) | 6/D/A/1 | RED WARE | 266 | 10950g | 34cm | - | AE |
| 2011 | KCH | 1 | (4) | 31/A/A/3 | B.R.W | 01 | 50g | 18cm | - | AC |
| 2011 | KCH | 1 | (4) | 18/A/A/1 | ROULETTED | 01 | <50g | 4cm | - | AB |
| 2011 | KCH | 1 | (4) | 62/F/B/2 | ROULETTED | 01 | <50g | 6cm | - | FGH |
| 2011 | KCH | 1 | (4) | 24/B/B/1 | RED WARE | 01 | 50g | - | - | I |
| 2011 | KCH | 1 | (4) | 26/A/A/1 | RED WARE | 01 | 50g | - | - | I |
| 2011 | KCH | 1 | (4) | 79/A/A/1 | RED WARE | 01 | 50g | 4cm | Disk | - |
| 2011 | KCH | 1 | (4) | 79/A/A/1 | B.R.W | 01 | 50g | 4cm | Disk | - |
| 2011 | KCH | 1 | (4) | 79/A/A/1 | B.R.W.DECARETION | 01 | 50g | 4cm | Disk | - |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2011 | KCH | 1 | (4) | 79/A/A/1 | R.W.THICKNE SION | 03 | 100g | 3cm | Disk | - |
| 2011 | KCH | 1 | (4) | 79/A/A/1 | | 01 | 50g | 3cm | Dick | - |
| 2011 | KCH | 1 | (4) | 79/A/A/1 | RED WARE | 01 | <50g | 2cm | Disk | - |
| 2011 | KCH | 1 | (4) | 79/A/A/1 | RED WARE | 01 | <50g | 1 | Dick | - |
| 2011 | KCH | 1 | (4) | 82/A/A/1 | RED WARE | 01 | 50g | - | - | - |
| 2011 | KCH | 1 | (4) | 79/A/A/1 | R.W.THICKNE S | 4/3 | 50g | 4cm | Disk | - |
| 2011 | KCH | 1 | (4) | 79/A/A/1 | RED WARE | 4/1 | <50g | 4cm` | Disk | - |
| 2011 | KCH | 1 | (4) | 79/A/A/1 | B.R.W | 01 | <50g | 4cm | Disk | - |
| 2011 | KCH | 1 | (4) | 24/A/A/1 | RED WARE | 01 | <50g | - | - | I |
| 2011 | KCH | 1 | (4) | 24/B/B/1 | RED WARE | 01 | <50g | - | - | I |
| 2011 | KCH | 1 | (4) | 26/A/A/1 | RED WARE | 01 | <50g | - | - | I |
| 2011 | KCH | 1 | (4) | 66/A/A/1 | RED WARE | 02 | <50g | 24cm | - | AE |
| 2011 | KCH | 1 | (4) | 31/A/A/2 | R.P.WARE | 01 | <50g | 22cm | - | Ac |
| 2011 | KCH | 1 | (4) | 31/A/A/2 | RED WARE | 10 | 180g | 22cm | - | AC |
| 2011 | KCH | 1 | (4) | 28/B/A/1 | RED WARE | 13 | 450g | 28cm | - | AC |
| 2011 | KCH | 1 | (4) | 1/A/A/1 | RED WARE | 09 | 430g | 24cm | - | AE |
| 2011 | KCH | 1 | (4) | 1/C/A/1 | RED WARE | 01 | 50g | 20cm | - | AC |
| 2011 | KCH | 1 | (4) | 6/B/A/1 | RED WARE | 04 | 50g | 10cm | - | ABC |
| 2011 | KCH | 1 | (4) | 6/D/A/2 | RED WARE | 10 | 170g | 8cm | - | ABC |
| 2011 | KCH | 1 | (4) | 67/A/A/1 | RED WARE | 02 | 100g | 10cm | - | AE |
| 2011 | KCH | 1 | (4) | 4/A/A/1 | RED WARE | 02 | 50g | 18Cm | - | AB |
| 2011 | KCH | 1 | (4) | 8/A/A/1 | RED WARE | 01 | 50g | 8cm | - | AB |
| 2011 | KCH | 1 | (4) | 6/E/A/1 | RED WARE | 01 | <50g | 10cm | - | AB |
| 2011 | KCH | 1 | (4) | 2/A/A/1 | RED WARE | 18 | 1600g | 16cm | - | AB |
| 2011 | KCH | 1 | (4) | 4/A/A/3 | RED WARE | 01 | 50g | 12cm | - | AB |
| 2011 | KCH | 1 | (4) | 66/B/A/1 | RED WARE | 29 | 650g | 28cm | - | AE |
| 2011 | KCH | 1 | (4) | 36/D/A/1 | RED WARE | 01 | <50g | 16cm | - | AC |
| 2011 | KCH | 1 | (4) | 36/E/B/1 | RED WARE | 01 | <50g | 18cm | - | AC |
| 2011 | KCH | 1 | (4) | 4/A/A/1 | RED WARE | 02 | 50g | 16cm | - | ABC |
| 2011 | KCH | 1 | (4) | 6/M/A/1 | RED WARE | 02 | <50g | 14cm | - | ABC |
| 2011 | KCH | 1 | (4) | 14/R/A/1 | RED WARE | 01 | <50g | 12cm | - | ABC |
| 2011 | KCH | 1 | (4) | 67/A/A/2 | RED WARE | 01 | <50g | 12cm | - | - |
| 2011 | KCH | 1 | (4) | 20/A/A/1 | RED WARE | 01 | <50g | 12cm | - | AB |
| 2011 | KCH | 1 | (4) | 20/A/B/1 | RED WARE | 01 | <50g | 12cm | | AB |
| 2011 | KCH | 1 | (4) | 66/A/A/1 | RED WARE | 06 | 150g | 24cm | - | AE |
| 2011 | KCH | 1 | (4) | 2/A/A/1 | RED WARE | 02 | 50g | 22cm | - | AC |
| 2011 | KCH | 1 | (4) | 10/D/A/2 | RED WARE | 16 | 380g | 10cm | - | ABC |
| 2011 | KCH | 1 | (4) | 7/A/A/1 | RED WARE | 02 | 150g | 12cm | - | ABC |
| 2011 | KCH | 1 | (4) | 2/H/A/1 | RED WARE | 02 | <50g | 18cm | | ABC |
| 2011 | KCH | 1 | (4) | 4/I/A/1 | RED WARE | 02 | <50g | 22cm | - | ABC |
| 2011 | KCH | 1 | (4) | 6/B/A/2 | RED WARE | 11 | 500g | 24cm | - | AC |
| 2011 | KCH | 1 | (4) | 31/A/A/2 | RED WARE | 04 | 50g | 20cm | - | A |
| 2011 | KCH | 1 | (4) | 1/A/A/1 | RED WARE | 29 | 1100g | 10cm | - | AC |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2011 | KCH | 1 | (4) | 6/B/A/1 | RED WARE | 01 | 50g | 18cm | - | ABC |
| 2011 | KCH | 1 | (4) | 10/B/A/1 | RED WARE | 02 | 50g | 08cm | - | ABC |
| 2011 | KCH | 1 | (4) | 14/R/A/1 | RED WARE | 01 | 50g | 08cm | - | ABC |
| 2011 | KCH | 1 | (4) | 14/A/A/2 | RED WARE | 01 | <50g | 16cm | - | ABC |
| 2011 | KCH | 1 | (4) | 14/P/A/1 | RED WARE | 01 | <50g | 12cm | - | ABC |
| 2011 | KCH | 1 | (4) | 2/A/A/1 | RED WARE | 01 | <50g | 14cm | - | ABC |
| 2011 | KCH | 1 | (4) | 10/E/A/1 | RED WARE | 03 | 100g | 14cm | - | ABC |
| 2011 | KCH | 1 | (4) | 15/A/A/1 | RED WARE | 01 | 50g | 16cm | - | ABC |
| 2011 | KCH | 1 | (4) | 2/B/A/1 | RED WARE | 04 | 500g | 28cm | - | AC |
| 2011 | KCH | 1 | (4) | 2/G/A/1 | RED WARE | 02 | <50g | 14cm | - | ABC |
| 2011 | KCH | 1 | (4) | 2/E/A/1 | RED WARE | 02 | 50g | 24cm | - | AC |
| 2011 | KCH | 1 | (4) | 2/I/A/2 | RED WARE | 02 | <50g | 18cm | - | ABC |
| 2011 | KCH | 1 | (4) | 3/A/A/1 | RED WARE | 02 | <50g | 18cm | - | ABC |
| 2011 | KCH | 1 | (4) | 4/M/A/1 | RED WARE | 03 | <50g | 22cm | - | ABC |
| 2011 | KCH | 1 | (4) | 10/A/A/1 | RED WARE | 02 | <50g | 10cm | - | ABC |
| 2011 | KCH | 1 | (4) | 14/J/A/1 | RED WARE | 01 | <50g | 14cm | - | ABC |
| 2011 | KCH | 1 | (4) | 2/F/A/1 | RED WARE | 01 | <50g | 18cm | - | ABC |
| 2011 | KCH | 1 | (4) | 2/F/C/1 | RED WARE | 01 | <50g | 18cm | - | ABC |
| 2011 | KCH | 1 | (4) | 31/B/A/1 | B.R.W | 01 | <50g | 12cm | - | AC |
| 2011 | KCH | 1 | (4) | 31/B/A/1 | RED WARE | 01 | <50g | 12cm | - | AC |
| 2011 | KCH | 1 | (4) | 14/A/B/1 | RED WARE | 01 | <50g | 14cm | - | ABC |
| 2011 | KCH | 1 | (4) | 14/C/A/1 | RED WARE | 03 | <50g | 10cm | - | AC |
| | | | | | | | | | | |
| 2011 | KCH | 3 | (5F) | 79/A/A/1 | RED WARE | 01 | <50g | 3cm | Disk | - |
| 2011 | KCH | 3 | (5F) | 6/D/A/1 | RED WARE | 54 | 2800g | 34cm | - | ABC |
| 2011 | KCH | 3 | (5F) | - | TILES | 01 | <50g | - | - | - |
| 2011 | KCH | 3 | (5F) | 66/B/A//1 | RED WARE | 03 | 80g | 20cm | _ | AE |
| 2011 | KCH | 3 | (5F) | 28/B/A/1 | RED WARE | 17 | 300g | 24cm | - | AE |
| 2011 | KCH | 3 | (5F) | 8/N/A/1 | RED WARE | 01 | 260g | 24cm | - | ABC |
| 2011 | KCH | 3 | (5F) | 65/B/A/1 | RED WARE | 05 | 60g | 22cm | - | A |
| 2011 | KCH | 3 | (5F) | 31/A/A/2 | RED WARE | 15 | 250g | 22cm | - | AC |
| 2011 | KCH | 3 | (5F) | 30/A/A/3 | RED WARE | 01 | 50g | 22cm | - | AC |
| 2011 | KCH | 3 | (5F) | 14/A/B/1 | RED WARE | 22 | 700g | 14cm | - | ABC |
| 2011 | KCH | 3 | (5F) | 1/B/A/1 | RED WARE | 06 | 200g | 18cm | - | AC |
| 2011 | KCH | 3 | (5F) | 6/B/A/1 | RED WARE | 01 | 100g | 18cm | - | ABC |
| 2011 | KCH | 3 | (5F) | 10/D/A/2 | RED WARE | 02 | 50g | 12cm | - | AB |
| 2011 | KCH | 3 | (5F) | 12/A/A/1 | RED WARE | 01 | <50g | 24cm | - | ABC |
| 2011 | KCH | 3 | (5F) | 6/D/A/1 | RED WARE | 11 | 250g | 22cm | - | ABC |
| 2011 | KCH | 3 | (5F) | 38/B/A/3 | RED WARE | 03 | <50g | 6cm | - | AC |
| 2011 | KCH | 3 | (5F) | 1/F/A/2 | RED WARE | 01 | <50g | 16cm | - | AE |
| | | | | | | | | | | |
| 2011 | KCH | 1 | (7) | 31/A/A/1 | RED WARE | 01 | <50g | 12cm | - | AC |
| 2011 | KCH | 1 | (7) | 2/B/A/1 | RED WARE | 01 | <50g | 20cm | - | AB |
| 2011 | KCH | 1 | (7) | 37/A/D/1 | RED WARE | 01 | <50g | 14cm | - | AE |
| 2011 | KCH | 1 | (7) | 34/A/B/1 | ROULETTED | 01 | <50g | 4cm | - | AC |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2011 | KCH | 1 | (7) | 79/A/A/1 | R.W THICKNESS | 01 | <50g | 3cm | Disk | - |
| 2011 | KCH | 1 | (7) | 79/A/A/1 | RED WARE | 01 | <50g | 1cm | Disk | - |
| 2011 | KCH | 1 | (7) | 6/D/A/1 | RED WARE | 54 | 1800g | 32cm | - | AC |
| 2011 | KCH | 1 | (7) | 31/A/A/1 | RED WARE | 10 | 180g | 30cm | - | AC |
| 2011 | KCH | 1 | (7) | 28/B/A/1 | RED WARE | 25 | 750g | 32cm | - | AE |
| 2011 | KCH | 1 | (7) | 7/B/A/1 | RED WARE | 01 | 100g | 16cm | - | ABC |
| 2011 | KCH | 1 | (7) | 8/N/A/1 | RED WARE | 01 | 100g | 20cm | - | ABC |
| 2011 | KCH | 1 | (7) | 1/E/A/1 | RED WARE | 03 | 100g | 28cm | - | AE |
| 2011 | KCH | 1 | (7) | 6/J/A/2 | RED WARE | 01 | 50g | 18cm | - | ABC |
| 2011 | KCH | 1 | (7) | 76 | TILES | 01 | 50g | - | - | abcd |
| 2011 | KCH | 1 | (7) | 8/A/A/2 | RED WARE | 01 | <50g | 12cm | - | ABC |
| 2011 | KCH | 1 | (7) | 10/E/A/1 | RED WARE | 01 | <50g | 10cm | - | ABC |
| | | | | | | | | | | |
| 2011 | KCH | 3 | (7) | 2/F/C/1 | RED WARE | 02 | 50g | 24cm | - | ABC |
| 2011 | KCH | 3 | (7) | 6/D/A/1 | RED WARE | 05 | 180g | 18cm | - | AC |
| 2011 | KCH | 3 | (7) | 31/A/A/1 | RED WARE | 07 | 130g | 22cm | - | AC |
| | | | | | | | | | | |
| 2011 | KCH | 3 | (8) | 31/B/A/1 | B.R.W ROULETTED | 01 | <50g | 20cm | - | AC |
| 2011 | KCH | 3 | (8) | 6/D/A/1 | RED WARE | 26 | 1000g | 18cm | - | AC |
| 2011 | KCH | 3 | (8) | 31/A/A/1 | RED WARE | 16 | 500g | 18cm | - | AC |
| 2011 | KCH | 3 | (8) | 1/E/A/4 | RED WARE | 01 | <50g | 20cm | - | AE |
| 2011 | KCH | 3 | (8) | 20/A/A/1 | RED WARE | 01 | <50g | 12cm | - | AB |
| 2011 | KCH | 3 | (8) | 14/P/A/1 | RED WARE | 01 | <50g | 12cm | - | AB |
| 2011 | KCH | 3 | (8) | 14/C/A/1 | RED WARE | 01 | <50g | 18cm | - | AB |
| 2011 | KCH | 3 | (8) | 1/F/A/1 | RED WARE | 01 | <50g | 16cm | - | ABC |
| | | | | | | | | | | |
| 2011 | KCH | 1 | (10f) | 6/D/A/2 | RED WARE | 01 | 50g | 20cm | - | AC |
| 2011 | KCH | 1 | (10f) | 6/J/A/2 | RED WARE | 02 | <50g | 14cm | - | AB |
| | | | | | | | | | | |
| 2011 | KCH | 1 | (20) | 56/A/A/1 | RED WARE | 01 | 50g | - | - | AC |
| | | | | | | | | | | |
| 2011 | KCH | 2B | (20) | 30/A/A/2 | B.R.W | 02 | <50g | 18cm | - | AC |

Kuchchaveli (KCH) Ceramics/Pottery Analysis Report - 2011-2012

Prepared by G.Samaranayake

# ත්‍රිකුණාමලය කුච්චවේලි

## මැටි බඳුන් වාර්තාව

2011 - 2012.

වාර්තාව සැකසීම

ගාමිණී අබේසිරි සමරනායක.

# කුච්චවේලී කැණීම් පරිශ්‍රය 2011

කුච්චවේලී කැණීම් පරිශ්‍රයේ සිදු කරන ලද K C H 1, K C H 3 , K C H 6 ,පර්යේෂණ කැණීම් මගින් මැටි බඳුන් විශාල ප්‍රමාණයක් සොයා ගන්නා ලදී .එම බඳුන් අතරින් වැඩි ප්‍රමාණයක් දේශීය බඳුන් විශේෂයන්ට අයත් වේ. ඒවා ද ක්‍රි:ව: 6 වන ශත වර්ෂයේ සිට ක්‍රි:ව: 10 වන ශත වර්ෂය දක්වා යුගයන්ට අයත් වේ. (මධ්‍ය ඓතිහාසික යුගයන්ට) 10 වෙනි ශත වර්ෂයේ සිට 14 වෙනි ශත වර්ෂය දක්වා කාල පරාශයන්ට අයත් මැටි බඳුන් නොමැති තරම්ය. ඊට පසු අවධීන්ට අයත් මැටි බඳුන් ස්වල්පයක් දැක ගත හැකි අතර මතු පිට ස්තර තුල මේවා දැක ගත හැකිය. මෙම බඳුන් අනුරාධපුර පුරාවිද්‍යා ස්ථාන වල දැක ගත නොහැකි අතර ඒවා මේ ප්‍රදේශයටම ආවේනික වන්නට ඇත. ගැටි හා බඳ කොටස් එතරම් සණකම් නොවන මෙම බඳුන්වල පිටත හා ඇතුලත මෝස්තර රටා බහුලව දැක ගත හැකිය. හින්දු සංස්කෘතියට බොහෝවිට නෑකම් කියන බඳුන් විය හැකිය.

ස්ථානයේ දැක ගත හැකි විශේෂිත මැටි බඳුන් වර්ග අතර කාල රක්ත වර්ණ බඳුන් අඩු ප්‍රතිශතයකින් දැක ගත හැකි විය. ඒ අතර පාත්‍රා, කුඩා පාත්‍රා, ඇතිලි හැඩ තුන පමණක් හමු විය. මේ අතුරෙන් K C H 1 (20) වෙනි ස්තරයෙන් ලැබුණු පාත්‍රය 1969 ඇතුළු නුවර කැණීම් මගින් හමුවූ 16/A/A/1 පාත්‍රයට සමාන විය. අප විසින් කරන ලද මෙම වර්ගීකරන චක්‍රයේ 30/A/A/2 හැඩයට අයත් වේ. මෙම වර්ගයේ පාත්‍ර මෙගලතික සුසාන භූමි වලින් ද අනුරාධපුර ඇතුළු නුවරින් හා කැලණිය පිලපිටිය, තිස්සමහාරාම අකුරුගොඩ, යාපනේ කණ්දරෝඩය, මන්නාරම තිරුකේතීස්වරම් යන පුරාවිද්‍යා භූමිවලින් ද හමු වී ඇත. මෙම බඳුන් විශේෂය ක්‍රි:පූ: 900 දක්වා අතීතයකට කාලණීර්ණය කර ඇත. එසේ වුව ද මෙම ස්ථානයෙන් හමු වුයේ එක් කැබැල්ලක් හෙයින් මෙය පසු කාලීනව ස්ථානයට වෙනත් කාර්යක් සඳහා ගෙනවිත් තැම්පත් කලා ද යන්න සැක සහිතය. විශේෂයෙන්ම හමු වූ මෙම මැටි බඳුන් කැබැල්ල මීට පෙර ස්ථානයේ සිදු කරන ලද බුදු පිළිමය පාමුල තිබීම ඉහත නිගමනයට එළඹීමට සාක්ෂියකි. ගෙඩිගේ වාර්තාවේ (1969) හමු වු 3H ඇතිලි ගැටියක් මෙම ස්ථානයෙන් ද හමුවී ඇත. (කාල රක්ත වර්ණ) එය ද ස්ථානයේ පැරණි බව සනාථ කරන සාධකයක් ලෙස යොදා ගත හැකිය. ඒ අනුව ස්ථානය කාල නිගමනයේ දී මෙමගින් යම් පිටු බලයක් ලබා ගත හැකිය.

gary ware මෙම හැඩයේ බඳුන් කැබලි ස්වල්පයක් හමු වුව ද ඒවා තාක්ෂණික වශයෙන් එතරම් ඉහළ මට්ටමක නොවේ. තැටි හැඩයේ පතුල කොටස් මේ අතර වේ. මේවා ද ක්‍රි:ව: 1 වන ශත වර්ෂයෙන් පසු යුගයන්ට අයත් බවට නිර්මාණ ලක්ෂණ අනුව සඳහන් කළ හැකිය.

රක්ත වර්ණ ආලේපිත මැටිබඳුන් කැබලි ඉතාමත් ස්වල්පයක් හමු වු අතර ඒවා ගුරු ලේන්තු කොතල හෝ පැන්කෙන්ඩි හැඩයට අයත් වේ. නිර්මාණ ලක්ෂණ අනුව ක්‍රි:ව: 6-8 සියවස් වලට අයත් විය හැකිය.

පඬුවන් පැහැ මැටි බඳුන් (buff ware) මෙම වර්ගයේ බඳුන් වලට අයත් බඳ කොටස් ස්වල්පයක් හමු වු අතර ඒවා බෙහෙවින් ඛාදනයට ලක්ව ඇත. මෙම වර්ගයේ එක් බඳ කොටසක ඇතුලත කළු පැහැති දුම්මල ආලේපයක් දැක ගත හැකි විය. විදේශීය සම්බන්ධතා සමගින් අරාබි දේශයෙන් මෙම බඳුන් මෙරටට පැමිණ ඇත. බොහෝ විට මෙය ක්‍රි:ව: 1 වන ශත වර්ෂයෙන් පසු බහුලව භාවිතා වී ඇත.

C H .WARE මැටි බඳුන් ක්‍රි:ව: 6 වෙනි ශත වර්ෂයෙන් පසු පොළොන්නරු අවධිය දක්වා බහුලව භාවිතා වී ඇත. මධ්‍යම සංස්කෘතික අරමුදලේ අභයගිරිය,ජේතවනය,සීගිරිය,පොළොන්නරුව කැණීම් පරිශ්‍රයන් තුල ගොඩනැගිලි පාදා ගැනීමේ කටයුතු වල දී බහුල වශයෙන් මේවා හමු වේ.මුව විට ඇති ගැටිය සණකම් වන අතර පුළුල්ව විහිදෙන බඳ කොටස පතුල දක්වා දිව යන විට බෙහෙවින්ම තුනීවන

මෙම බඳුන් ආගමික වශයෙන් පැවති ස්ථාන වල බහුලව භාවිත වී ඇත. නිර්මාණ ලක්ෂණ අනුව පාත්‍ර හැඩය විශේෂිතය.මෙවැනි බඳුන් කැබලි කිහිපයක් කුච්චවේලියෙන් ද හමු වී ඇත.

සමස්ත භූමියෙන් ලැබුණු බඳුන් කොටස් අතර බඳ කොටස සණකමින් වැඩි බඳුන් කැබලි වැඩි වශයෙන්ම හමු වුව ද ඒවා කැබලි වලට කැඩී ඇති හෙයින් කිනම් බඳුන් වලට අයත් බඳුන් ද යන්න නිශ්චය අපහසුය. කෙස් වුව ද මෙම සණකම් බඳුන් ජලය පරිහරනයේ දී හෝ ද්‍රව්‍ය අසුරා තැබීමේ බඳුන්වලට අයත් බවට නිගමනය කළ හැකිය.

සමස්ථ කැණීම් භූමියෙන් සොයා ගන්නා ලද මැටි බඳුන් අතර ඉහත වර්ගයන් දැක ගත හැකි වුව ද කාලණීර්ණය සඳහා ඒවා යොදා ගැනීමේදී පස් ස්තර කාලණීර්ණය කිරීම සිදු කළ යුතුය. එසේම බඳුන් කැබළි ද විද්‍යාත්මක කාලණීර්ණයකට බඳුන් කළ යුතුය. එසේ නොමැතිව මැටි බඳුන් මත පිහිටා සාපේක්ෂ කාලනීර්ණයක් දීමට තරම් ප්‍රමාණවත් බඳුන් කැබළි ස්ථානයෙන් සොයා ගැනීමට නොහැකි වූ බව සඳහන් කළ යුතුය.

සමස්ථ භූමියෙන් සොයා ගන්නා ලද ඉහත මැටි බඳුන් වර්ග කෙරේ අවධානය යොමු කර සාපේක්ෂ කාලණීර්ණයක් ලබා දීමට තරම් ප්‍රමණවත් නොවේ.

**අංක 01 හැඩය :-**

නැඹිලි ,කොරස්, මැටි කෝප්ප හැඩයට අයත් මෙම බඳුන් බොහෝ විට ක්‍රිංවං 07 වන ශත වර්ෂයෙන් පසුව බහුල ලෙස භාවිතයට පැමිණ ඇති අතර පුරාවිද්‍යා ස්ථාන වල මතුපිට පොළොව මට්ටමේ දැක ගත හැකි නිර්මාණයන් වේ. රතු පැහැති මැටි උපයෝගී කරගෙන නිර්මාණය කර ඇති මෙම බඳුන්වල ඇතුලත නැඹිලි වල දක්නට ඇති රේඛාමය ලක්ෂණ පිටත කුඹල් පත්ත සලකුණ ද දැක ගත හැකිය. තරමක් ඝණකම් මෙම බඳුන් එදිනෙදා භාවිතය සඳහා යොදා ගෙන ඇත. තාක්ෂණික වශයෙන් එතරම් වැදගත් කමක් නොමැති මෙම බඳුන් විශේෂයේ ගැටිය කොටස වැඩි ඝණකමෙන් යුතුය. පොදුවේ ක්‍රිංවං 07 වන ශත වර්ෂයේ සිට ඉදිරියට මෙම බඳුන් භාවිතයේ පැවතුනි.

**අංක 02 හැඩය ඇතිලි :-**

කාලරක්ත වර්ණ හා රක්ත වර්ණ යන ක්‍රම වේද දෙක යටතට අයත් මැටි බඳුන් කොටස් මෙම කැණීම තුලින් හමු වුව ද කාල රක්ත වර්ණ බඳුන් ඒ අතරින් කිහිපයක් පමනක් හමු විය. පස් ස්තර කාල නීර්ණය තුලින් දින වකවානු තීරනය කරන තෙක් නිවැරදි කාල නීර්ණයක් ඉදිරිපත් කල නොහැක. කෙසේ වුව ද ක්‍රිංපූං 3 වන ශත වර්ෂයත් ක්‍රිං වං 7 වන ශත වර්ෂයත් අතර කාලයට හමු වූ මැටි බඳුන් සියල්ල අයත් කාලයට කාල නිගමනය කල හැකිය. හැඩතල චක්‍රයෙන් 2/F/C/1 කැබලි කිහිපය වඩා පැරණි නිර්මාණ ලෙසට සඳහන් කල හැකි අතර එම හැඩයේ නිර්මාණ බොහෝ විට කාල රක්ත වර්ණ හැඩයෙන් යුත්තය.

**අංක 3 හැඩය කුඩා ප්‍රමාණයේ ඇතිලිඃ-**

මෙම හැඩයට අයත් බඳුන් කැබලි සීමිත සංඛ්‍යාවක් හමු වූ අතර ඒවා සියල්ල රක්ත වර්ණ බඳුන් ඝණයට අයත් වේ. හැඩය හා නිර්මාණ ලක්ෂණ අනුව ක්‍රිංවං 3-7 කාලයට අයත් යැයි අනුමාන කල හැකිය.

**අංක 04 හැඩය ඇතිලි :-**

කාලරක්ත වර්ණ තාක්ෂණය යටතේ නිෂ්පාදනය කර ඇති මෙම බඳුන් විශේෂය තාක්ෂණික අතින් වැඩි වැදගත් කමක් උසුලනු ලබයි. මෙම හැඩයේ බඳුන් ක්‍රිංපූං 6 වන සිය වසේ සිට භාවිතයේ පැවතුන බවට සාධක බොහෝ පුරාවිද්‍යාත්මක භූමි වලින් තහවුරු කරගෙන ඇත. කාල රක්ත වර්ණ තාක්ෂණයේ මැටි බඳුන් මේ අතුරෙන් වැදගත් වේ. 1969 ගෙඩිගේ ප්‍රදේශය ආශ්‍රිව සිදු කරන ලද කැණීම් වලදී මෙන්ම පසුව ඇතුල් නුවර ආශ්‍රිතව සිදු කරන ලද කැණීම් වල දී 3H දරණ කාල රක්ත වර්ණ මැටි බඳුන් හැඩයෙහි කාල නීර්ණය කරන ලද මැටි බඳුන් වලට සමාන තාවයක් උසුලන බඳුන් කැබලි කිහිපයක් මෙම කුච්චවේලි කැණීම් තුලින් ද හමුවී ඇත. කෙසේ වුව ද මෙම බඳුන් ක්‍රිංපූං 700ත් ක්‍රිංවං 3 වන ශත වර්ෂයත් අතර කාල පරාසයට ඇතුල්වන හෙයින් පස් ස්තර කාලණීර්ණය තුලින් දින වකවානු ලබා දෙන තෙක් කිනම් කාලයට ද යන්න නිශ්චය කරීම අපහසු වේ.

ඇතිලි හැඩයට අයත් රක්ත වර්ණ මැටි බඳුන් බොහොමයක් ක්‍රිං වං 3 වන ශත වර්ෂයෙන් පසුව නිර්මාණය කරන ලද ඒවා බවට එම නිමැවුම් ලක්ෂණ මෙන්ම එහි ඇති තාක්ෂණික ශිල්පය පරික්ෂාවෙන් පෙනී යනු ඇත. කෙසේ වුව ද ක්‍රිං වං 7 වන ශත වර්ෂය වන විට මෙම බඳුන් වල තාක්ෂණය තරමක් දුර්වල වී ඇත. එසේ හෙයින් අදාල කැණීම් තුලදී සොයා ගන්නා ලද රක්ත වර්ණ ඇතිලි වලට අයත් මැටි බඳුන් කැබලි ක්‍රිංවං 3-7 වර්ෂයට අයත් බවට නිගමනය කළ හැක.

**අංක 06 හැඩය මුට්ටි හෝ හැලි :-**

පිටතට විහිදුණු පුළුල් බඳ කොටසක් සහිතව හමු වූ මෙම බඳුන්වල ගණකම් වූ ගැටියක් දැක ගත හැකි වේ. හමු වූ නිර්මාණ අතර හැඩතල සටහනේ දක්වා ඇති ආකාරයට ක්‍රි:ව: 6-8 සියවස් වලට අයත් නිර්මාණ ලෙස හඳුනා ගතහැකි විය. තාක්ෂණික අතින් දුර්වල මෙම නිමැවුම් වල පිටත කුඹල් පත්තේ සලකුණු දැකගත හැකි විය. ගබඩා කරණ කටයුතු සඳහා යොදාගන්නට ඇතැයි අනුමාන කරන මෙම මුට්ටි විශේෂය කැණීම් භූමි වල මතු පිට ස්තරවල දී බහුල වශයෙන් දැක ගත හැකිවේ.

**අංක 07 හැඩය හැලි:-**

තාක්ෂණික අතින් 06 හැඩයට වඩා උසස් මෙම නිර්මාණ අතර රක්ත වර්ණ හෝ කාල රක්ත වර්ණ බඳුන් දැක ගත හැකිය. නමුත් මෙම කැණීමෙන් සොයාගත හැකි වූයේ රක්ත වර්ණ බඳුන් කැබලි කිහිපයක් පමණි. මේවා ක්‍රි:ව: 3 වන ශත වර්ෂයේ සිට 7 වන ශත වර්ෂය දක්වා ඇත කාලයට අයත් යැයි නිගමනය කළ හැකිය. ශක්තිමත් ගැටියකින් හා පුළුල්ව විහිදෙන බඳ කොටසකින් යුත් මෙම නිර්මාණයන් ද ද්‍රව්‍ය ඇසරුම් සඳහා යොදා ගන්නට ඇතැයි අනුමාන කරයි. මෙම හැඩයේ බඳුන් කැණීම් භූමි වලින් හමු වනුයේ සීමිත වශයෙනි. තාක්ෂණික අතින් උසස් මෙම නිමැවුම් සඳහා භාවිතා කළ මැටි වර්ග ශක්තිමත් හෙයින් මෙම බඳුන් බෙහෙවින් අලංකාරය.

**අංක 07 හැඩය:- මුට්ටි හෝ හැලි**

මුට්ටි හෝ හැලිවලට අයත් ගැටි කැබලි මෙම අංකය යටතේ විග්‍රහ කෙරේ. හමු වූ නිර්මාණ අතර ඇති බොහෝ නිර්මාණ ක්‍රි:ව: 8 වන ශත වර්ෂයට පෙර යුගයන්ට අයත් ඒවා බවට නිගමනය කළ හැකිය. සමස්ථයක් ලෙස තාක්ෂණික අතින් මධ්‍යම ප්‍රමාණයේ නිර්මාණ ලෙස හඳුනා ගත හැකිය. ඉහත සඳන් කළ අංක 06 07 හැඩයන්ට සමාන හැඩයන් බව සඳහන් කළ යුතුය.

**අංක 10 හැඩය :- මුට්ටි**

තාක්ෂණික අතින් තරමක් උසස් මෙම නිර්මාණ ද ක්‍රි: ව: 3-7 ශත වර්ෂයට අයත් බවට නිගමනය කළ හැකිය. ගැඹුරු ළිං වලින් ජලය පිටතට ලබා ගැනම සඳහා මෙවැනි හැඩයේ නිර්මාණ යොදා ගත් බවට තොරතුරු ඇතුල් නුවර සිදු කරනු ලැබූ පුරාවිද්‍යා පර්යේෂණ කැණීම් මගින් තහවුරු කරගෙන ඇත. කුච්චවේලී කැණීම් බිමෙන් හමුවුණු මෙම රක්ත වර්ණ මුට්ටි වලට අයත් බඳුන් වල ගැටි කැබලි වල ශක්තිමත් භාවය අනුව ඉහත කාර්යය සඳහා මෙම බඳුන් යොදාගන්නට ඇතැයි අනුමාන කල හැකිය.

**අංක 14 හැඩය කළ මුට්ටි**

කළ හෝ මුට්ටි හැඩයේ බඳුන් මේ යටතට ගැනේ. හමු වූ නිර්මාණ අතර මැට්ටේ ස්භාවය හා තාක්ෂණික ලක්ණ අනුව ක්‍රි:ව: 3 වන ශත වර්ෂයත් 9 වන ශත වර්ෂයත් අතර යුගයන්ට අයත් බව නිගමනය කළ හැකිය. හමු වූ සියලු හැඩයන් සාමාන්‍ය මැටියෙන් නිර්මාණය කර ඇත. එරම් ශක්තිමත් නැත.

**අංක 15 හැඩය ගැටිය ඝණකම් කළ හෝ මුට්ටි:-**

තරමක් පුළුල් මුව විටක් සහිත මෙම බඳුන් වල ගැටිය ඝණකම්ය. දික් වූ කරක් සහිතය. මෙම ස්ථානයෙන් හමු වූ මෙම බඳුන් සියල්ල 14 හැඩයේ නිර්මාණ ලක්ෂණයන්ට හා තාක්ෂණික ලක්ෂණයන්ට බෙහෙවින් සමානය.

**අංක 19 හැඩය ගුරුලේත්තු ,පැන් කෙන්ඩි හෝ කොතළ හැඩයඃ-**

ඉහත හැඩයන්ට අයත් නිර්මාණ කිහිපයක් හමු වූ අතර ඒවායි වැඩි ප්‍රමාණයක් පැන් කෙණ්ඩි හැඩයට අයත් වේ. එසේම පැන් කෙන්ඩි වල ඇති කෙමිය කොටස් ද බහුලව හමු වී ඇත. මෙම බඳුන් ද ක්‍රිඃවඃ 5-9 සියවස් වල බහුල වශයෙන් භාවිතා වී ඇත. මෙම ස්ථානයෙන් ලැබුණු මෙවැනි බඳුන් වල කෙමි කොටස් වල නිර්මාණ තාක්ෂණය අනුව 4-7 ශත වර්ෂවල භාවිත වු ඒවා බවට නිගමන කළ හැකි

**අංක 18 හැඩයය ගුරුලේත්තු පැන් කෙණ්ඩි හෝ කොතළ හැඩයඃ**

ඉහත අංක 19 යටතේ ඇති බඳුන් වල විස්තරයට බෙහෙවින් සමානය.

**අංක 23 හැඩය මුට්ටි හැඩයඃ-**

**7-9 සියවස් වලට අයත් මෙවැනි නිර්මාණ** බොහෝ පුරාවිද්‍යා ස්ථානවල මතු පිට ස්ථානයන් තුලින් බහුලව හමුවේ. බඳුනේ පිටතට පුළුල්ව විහිදෙන බඳක් සහිතව මෙම බඳුන් වල මුව විට බඳුනට සාපේක්ෂව කුඩාය.සණකම් වු ගැටියකින් හා බඳකින් යුතුය. එහි පිටත කුඹල් පත්තේ සලකුණු බොහෝ විට දැකගත හැකිය. සනීපාරක්ෂක කැසිකිළි පද්ධති තුල අපද්‍රව්‍ය බැහැර කිරීමේ පද්ධතිය තුල එකනෙකට සම්බන්ධ කළ මෙවැනි මුට්ටි දැක ගත හැකිය. මේවා ක්‍රිඃවඃ 7-9 සියවස් වල දී බහුල ලෙස භාවිතා කර ඇත.

**අංක 24 හැඩය පැන් කෙණ්ඩි වලට අයත් කෙමිය කොටස ඃ-**

අංක 19 විස්තරය හා සැසඳේ

**අංක 26 හැඩය තැටි හැඩයේ පාත්‍රඃ-**

අංක 24 හා 19 හා සැසඳේ.

**අංක 28 හැඩය තැටි හැඩයේ පාත්‍රඃ-**

නොගැඹුරු මෙම පාත්‍ර විශේය තැටි හැඩයට බොහෝ සෙයින් සමාන වේ. හමු වූ නිර්මාණ අතර දැක ගත හැකි තැටි වල නිර්මාණ ලක්ෂණ මැට්ටේ ස්භාවය හා තාක්ෂණික තත්ත්වය අනුව 6-9 සියවස් වලට අයත් බව නිගමනය කළ හැකිය. බොහෝ නිර්මාණ වල පිටත කුඹල් පත්තේ සලකුණ බහුල වශයෙන් දැකගත හැකිය.

**අංක 30 හැඩයඃ-**

මෙම හැඩයට අයත් පාත්‍ර කොටස් කිහිපයක් හමු වූ අතර ඒවා සියල්ල කාල රක්ත වර්ණ බඳුන් විශේෂයට අයත් වේ. 1969 ගෙඩිගේ වාර්තාවට අනුව මෙම හැඩයේ බඳුන් ක්‍රිඃපූඃ 6 වන ශත වර්ෂයට අයත් බවට නිගමනය කර ඇත. කෙසේ වුව ද මෙම ස්ථානයෙන් හමු වූ මෙම බඳුන් එම යුගයටම අයත් ද යන්න පැවසීම අසීරුය.හමු වූ බඳුන් ප්‍රමාණය සීමිත හෙයින් අනුරාධපුර වැනි ස්ථානයකින් පසු කාලීනව මෙම ස්ථානයට ගෙන එන ලද බඳුන් ද යන්න සැක සිතේ . විශේෂයෙන්ම බුදු පිළිම ආසන්නයේ මෙම බඳුන් තැන්පත් කර තිබුනේ නම් ඉහත නිගමනයට එළඹීම යුක්ති සහගතය . කෙසේ වුව ද ස්ථානයේ කාලනිර්ණයේ දී යොදාගත හැකි වඩා විශ්වාසනීය සාධකය මෙය බවට නිගමනය කළ හැකිය. මෙම බඳුන් කැබැල්ල විද්‍යාත්මක කාලනීර්ණයකට බඳුන් කිරීමෙන් හෝ එය අයත් පස් ස්තරය තුලින් ලබා ගන්නා අඟුරු සාම්පල් කාලනීර්ණයට බදුන් කළ හොත් කුච්චවේලි කැණීම් භූමියෙහි ඓතිහාසික තොරතුරු අනාවරනය කර ගත හැකිය.

**අංක 31 හැඩය පාත්‍ර ඃ-**

කාලරක්ත හා රක්ත වර්ණ මැටිටෙන් නිශ්පාදිත මෙම පාත්‍ර ඉහත 30 හැඩය තරම් පැරණි නොවේ. ගෙඩිගේ වාර්තාවේ 16/C හැඩය ලෙස නම් කර ඇති මෙම බඳුන් චක්‍රකාර හැඩයට සකසා ඇත. මෙවැනි පාත්‍ර ක්‍රිඃවඃ 3 වන ශත වර්ෂය දක්වා භාවිතයේ පැවතුනි. ඉහත පාත්‍ර අතර කාලරක්ත වර්ණ නිමවුම් ශක්තිමත් බවින් යුතු වුවද රක්ත වර්ණ ඒවා එතරම් තාක්ෂණික අතින උසස් ඒවා නොවේ. කෙසේ වුව ද මෙම පාත්‍ර කොටස් ද ස්ථානයේ කාල නීර්ණයේ දී බෙහෙවින් උපකාර කර ගත හැක.

**අංක 34 හැඩය කෝප්පඃ-**

මෙම හැඩයේ බඳුන් බොහෝ විට රූලේටඩ් වර්ගයට අයත් වේ. මෙවැනි එක් බඳුනක් පමණක් සොයා ගත හැකි විය. කුඩා ප්‍රමාණයේ කෝප්පයක් ලෙස මෙය භාවිතා කරන්නට ඇතැයි අනුමාන කළ හැක. ග්‍රීක හා රෝම ආභාෂයෙන් ඉන්දියාව හරහා මෙරට භාවිතයට ආ මෙම බඳුන් විශේෂය පෙරා පදම් කර ගන්නා ලද ලා රෝස පැහැති මැටි විශේෂයකින් නිමවා ඇත. ක්‍රිඃපූඃ 3 වන ශත වර්ෂයත් ක්‍රිඃවඃ4 වන ශත වර්ෂයත් අතර කාලයේ භාවිතා වී ඇති මෙම බඳුන් විශේෂය විදේශීය සම්බන්තා සමගින් මෙරට භාවිතයට පැමිණ ඇත. හමු වූ කැබැල්ලෙහි ප්‍රමාණය අනුව නිර්මාණ ලක්ෂණ පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීමට අපහසුය. කෙසේ වුව ද මෙම බඳුන් කැබැල්ල අයත් පස් ස්තරයන් කාල නීර්ණය කිරීම බෙහෙවින් වැදගත් වනු ඇත.

**අංක 36 හැඩය තැටි හෝ කෝප්පඃ-**

**මෙම බඳුන් විශේෂය** රක්ත වර්ණ මැටි බඳුන් හෝ ග්රේවෙයා වර්ගයේ මැටිටෙන් නිෂ්පාදිත අවස්ථා දැක ගත හැකිය. බඳුනෙහි සණකම හා හැඩය අනුවත් ඇතුලත යම් අවස්ථා වලදී දක්නට ඇති රූ සටහන් අනුවත් ක්‍රිඃවඃ 3 වන ශත වර්ෂයෙන් පසුව භාවිත නිර්මාණ බව හඳුනා ගත හැකිය.

**අංක 37 හැඩය කෝප්ප ඃ-**

ස්ථායෙන් හමු වූ මෙම හැඩයේ බඳුන් කීපය රක්ත වර්ණ මැටි බඳුන් විශේෂයට අයත් වන අතර එම නිර්මාණ එතරම් අතීතයට කාලනිර්ණය කිරීමට තරම් වැදගත් නිර්මාණ නොවේ. 37 අංකය දරණ කෝප්ප හැඩයේ බඳුන් අතර රූලේටඩ් , ග්‍රේවෙයා, කාලරක්ත වර්ණ, රක්ත වර්ණ බඳුන් විශේෂ දැක ගත හැකිය. එසේ වුව ද ස්ථානයෙන් හමු වූයේ රක්ත වර්ණ මැටි බඳුන් කැබලි කිහිපයක් පමණි.

**අංක 38 හඩය ගැඹුරු කෝප්පඃ-**

මෙම හැඩයට අයත්ව හමු වූ මැටි බඳුන් කැබලි ද කෝප්ප හැඩයට අයත් වුව ද එම හැඩයේ විශේෂ නිර්මාණ තරම් වැදගත් නොවේ. රක්ත වර්ණ එම බඳුන් නිර්මාණ තාක්ෂණය අනුව ක්‍රිඃවඃ 6 වෙනි සියවසේ පසු යුගයන්ට අයත් බව නිගමනය කළ හැකිය.

**අංක 56 හැඩය ගැඹුරු පාත්‍රඃ-**

**චොකලට් වෙයා හැඩයේ** මෙම පාත්‍ර බෙහෙවින් ගැඹුරු හැඩයෙන් යුක්තය. මුව විට ගැටිය උල් ස්භාවයක් ගන්නා අතර ඇතුලතින් සණකම්ය. පුළුල්ව විහිදෙන බඳ කොටසකින් යුක්තව බඳුනෙහි ඉහල සිට පතුල දක්වා යන විට බොහෝ තුනී වන ආකාරයට නිෂ්පාදනය කර ඇත. අළු පැහැති මැටි විශේෂයකින් නිර්මාණය කර සියුම් ලෙස ඔප ගන්වා ඇත. මෙනි බඳුන් ක්‍රිඃවඃ 8 වන ශත වර්ෂයේ සිට පොළොන්නරුව යුගය දක්වා බහුලව පැවති බවට අදාල කාල සීමාවට අයත් පුරාවිද්‍යාත්මක භූමී පරික්ෂාවේදී පෙනී ගොස් ඇත.

**අංක 60 හැඩය විශේෂිත ගැටි කැබලිඃ-**

මෙම හැඩයට අයත් බඳුන් විශේෂිත නිර්මාණයන්ට අයත් වුව ද බොහෝ විට හමු වනුයේ ගැටි කැබලි පමණි. තරමක් ශක්තිමත් මැටි විශේෂයකින් නිර්මාණය කර තිබුණ සම්පූර්ණ බඳුන් දැක ගත හැකි වීම තුල කාලනිර්ණයේදී හෝ බඳුනේ ස්භාවය අධ්‍යනයේදී ගැටලු සහගත තත්ත්වයක් උදා වී ඇත.

**අංක 62 හැඩය බඳුන්වල අඩිය කොටසඃ-**

හමු වී ඇති බඳුන්වලට අයත් සියලුම අඩිය කොටස් ක්‍රිඃවඃ 8-12 සියවස් වලට අයත් යැයි නිගමන කළ හැක. රක්ත වර්ණ මැටි භාණ්ඩ වලට අයත් මෙම අඩිය කොටස් නැඹිලි හෝ කොරස් හැඩයේ බඳුන් ලෙසට හඳුනා ගත හැකිය.

**අංක 65 හැඩය මූඩිඃ-**

කැණීම් භූමියෙන් හමු වූ මෙම බඳුන් සියල්ල රක්ත වර්ණ මැටිටෙන් නිශ්පාදිතය. නිමැවුම් තාක්ෂණය හැඩය හා මැටිටේ ස්භාවය අනුව ක්‍රිඃවඃ 8-12 සියවස් වලට අයත් බවට නිගමනය කළ හැකිය.

**අංක 66 හැඩය :-**

ඉහත අංක 65 හා සැසඳේ.

**අංක 67 හැඩයඃ-**

ඉහත අංක 65, 67 සමග සැසඳේ.

**අංක 79 හැඩය :-මැටි කව**

රක්ත වර්ණ හා කාල රක්ත වර්ණ මැටි බඳුන් වල කොටස් මගින් නිර්මාණය කර ඇති මෙවැනි කව විශාල ප්‍රමාණයක් හමු වී ඇත. ඒවා විවිධ සණකම් වලින් යුත්තය. මෙවැනි මැටි කව බොහෝ පුරාවිද්‍යා භූමි තුලින් හමුවේ. කිරුම් මිණුම් කටයුතු සඳහා හෝ යම් ක්‍රීඩා කටයුතු සඳහා මේවා යොදා ගත් බවට නොයෙක් දෙනා අතර මත පවතී.

**අංක 82 හැඩය මැටි බෝල :-**

රක්ත වර්ණ මැට්ටෙන් නිශ්පාදිත එක් මැටි බෝල වර්ගයක් පමණක් හු වී ඇත. එහි උපයෝගීතාවය පිළිබඳව සඳහන් කළ නොහැකිය.

මාර්තාව සැකසීමට සහය වූවන්

උදේනි කුසුම්

ශානිකා ප්‍රියංගනී.

මේකලා ගයන්ගි.

සැලසුම්

එස්. ජේ. සුනිල්.